**ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා සලසා තිබුණු එකතුව රු.110,285,000ක ප්‍රතිපාදනවලින්, සම්මාදම් හා දායක මුදල් (1505) වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනය වූ රු.10,800,000ක් සම්පූර්ණයෙන්ම වියදම් කර නොතිබුණු අතර මෙහෙයුම් කල්බදු හා වෙනත් දීමනා සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.10,409,857ක් හා රු.2,313,000ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12ක් හා සියයට 24ක් ඉතිරි වී තිබුණි. | 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛය අනුව නව බඳවා ගැනීම් අත්හිටුවීම සහ විශ්‍රාම යාමේ වයස් සීමාව ඉහළ නැංවීම, මෙහෙයුම් කල්බදු, කුලී ගිවිසුම් කාලය නැවත දීර්ඝ නොකිරීම, ඩොලර් සම්බන්ධ පැවති ගැටලු සහගත තත්ත්වය නිසා සාමාජික මුදල් බැංකුවෙන් ගෙවීමට නොහැකි වීම ආදි හේතුන් නිසා ප්‍රතිපාදන ඉතිරිය සිදු වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට හා ප්‍රතිපාදන අදාළ කාර්යයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2001) හා පර්යේෂණ සහ සංවර්ධන වියදම් (2507) සඳහා වෙන්කර තිබුණු එකතුව රු.10,000,000ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.1,164,557ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2022.04.26 දිනැතිව නිකුත්කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛය අනුව සහ භාණ්ඩාගාරය වෙතින් අපේක්ෂිත පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය සිදු වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට හා වෙන් කරන ලද ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු. රෙ. 94(1) පරිදි දරන ලද බැරකම් හා වැය ප්‍රමාණය කිසිම විටක වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයන් 03 ක් යටතේ වෙන් කර තිබුණු ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.634,867ක බැරකම් වලට බැඳි තිබුණි. | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන සීමාව තුළ පවතින බැඳීම් බව කාරුණිකව සඳහන් කරමි. එනමුත් සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් ඇති කරගත යුතු නොවන බවට උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. | අනුමත ප්‍රතිපාදනය ඉක්මවා බැඳීම් හා බැරකම් ඇති කර නොගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (ආ) ඡේදය | ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායි වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා කඩිනමින් ක්‍රියා කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සතු දෝෂ සහිත වාහන 03 ක් වසර 01 සිට වසර 05 දක්වා කාලයක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර අභාවිතව පැවතුණි. | අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් අලුත්වැඩියා කර ගැනීමට නොහැකි වී ඇත. | අලුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත් කර ගත හැකි වාහනවල අලුත්වැඩියාවන් කඩිනමින් සිදු කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 03 ත් වර්ෂ 08 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 08ක් සම්බන්ධයෙන් එකතුව රු.3,106,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | මෙම අලාභ හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව විසින් වාහන කිහිපයක අලාභ හානි සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, ඉතිරි වාහන සම්බන්ධව පරීක්ෂණ සිදු කරගෙන යනු ලැබේ. | පාඩු හා හානි අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අයකර ගත නොහැකි පාඩු හා හානි කපාහැරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.66,700,000 ක් වටිනා පර්චස් 75ක ඉඩමක් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ රු.59,304,347 ක් ගෙවා මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මෙම ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර වසර 13කට වැඩි කාලයක් | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිල දී ගත් ඉඩම දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු, සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම පරීක්ෂා කර මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මහා භාණ්ඩාගාරයෙන් | ඉඩම අප්‍රමාදව පවරාගෙන අවශ්‍ය ඉදිකිරීම් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගත වුවද මෙම ඉඩමේ කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. | ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇතත්, මේ අවස්ථාවේදී නව ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රතිපාදන ලබාදීමට හැකියාවක් නොමැති බව මහ භාණ්ඩාගාරය විසින් දන්වා ඇත. | |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්ක 15 ක වගාකරුවන් 32720 ක් සඳහා රබර් නැවත වගාව සහ නව වගාව වෙනුවෙන් ලබාදුන් වගා සහනාධාර මුදලින් වගාව අතහැර දැමීම නිසා වගාකරුවන් 3,327කගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.113,368,340 ක් අයවිය යුතුව තිබුණි. | අසාර්ථක වගාකරුවන් වෙත ගෙවන ලද සහනාධාර මුදල් අය කර ගැනීමට ලිපි යැවීම, රැස්වීම් පැවැත්වීම හා ක්ෂේත්‍ර නිලධාරීන් මාර්ගයෙන් මුදල් නැවත ගෙවීම සඳහා වගාකරුවන් දැනුවත් කිරීම ආදී ක්‍රියාමාර්ග රැසක් ප්‍රාදේශීය කාර්යාල විසින් ක්‍රියාත්මක කරන ලදි. | රබර් වගා සහනාධාර ලබාගෙන වගාව අතහැර දැමීමට හේතුවූ කරුණු පරීක්ෂා කර අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිල නිවාස 69ක නිත්‍යානුකූල අයිතිය වෙනත් රාජ්‍ය ආයතන සතුව පවතින අතර ඒවායේ අයිතිය විධිමත්ව පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | නිල නිවාස පිහිටි ඉඩම්වල අයිතිය පවතින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා රබර් පර්යේෂණායතනයෙන්, අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු එම ආයතන සමඟ සම්බන්ධිකරණය සිදු කරමින් පවතින අතර, පසුගිය වසරේ ඉඩම් 04ක පැවරීම් කටයුතු සිදු කරන ලදි. | නිල නිවාසවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල 03ක් යටතේ පවතින නිල නිවාස 12ක් වසර 03සිට 10 දක්වා කාලයක් පරිහරණයට නොගැනීමෙන් එම නිවාස ගරා වැටෙන තත්ත්වයට පත් වී තිබුණු අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවට ලබා ගත හැකි අදායම් මාර්ගයන් ද අහිමිවී තිබුණි. | නියමිත පරිදි නිල නිවාස නඩත්තු කිරීමට වර්ෂයකට දළ වශයෙන් වියදම් ලෙස රු. ලක්ෂ 100කට වැඩි මුදලක් අවශ්‍ය වන නමුත් වාර්ෂික ප්‍රතිපාදනවලින් ලැබෙන්නේ රු. ලක්ෂ 50ක පමණ මුදලක් බැවින් එක් වර්ෂයකට අපේක්ෂිත අලුත්වැඩියාවන් සියල්ලක්ම සිදුකර ගැනීමට හැකියාවක් නොලැබෙන අතර සමහර නිලනිවාස රබර් සංවර්ධන නිලධාරී කොට්ඨාශ කාර්යාල පවත්වාගෙන යාමේ කාර්යයට යොදා ගෙන ඇත. | විධිමත් අනුමැතියක් මත මෙම නිල නිවාස සුදුසු කාර්යයන්හි යොදවා ගැනීම සිදු කළ යුතු අතර අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමටද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලින් මෙම දෙපාර්තමේන්තුවට ලැබී වසර 01 සිට 11 දක්වා කාලයක් ගත වී තිබුණු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහන 04ක් හා යතුරුපැදි 16 ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නමට ලියාපදිංචි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | විමසුමේ සඳහන් කර ඇති මෝටර් වාහන 04 හා යතුරු පැදි 16 දෙපාර්තමේන්තුව නමට ලියාපදිංචි කර දෙන ලෙස වැවිලි අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. | දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති වාහන හා යතුරුපැදිවල පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 481ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 422ක් වූ බැවින් කාර්යමණ්ඩල පුරප්පාඩු 59ක් විගණනයේදී නිරීක්ෂණය විය. තත්‍ය කාර්ය මණ්ඩලය හා සලකා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු 59න් 47ක් දෙපාර්තමේන්තු ගත රබර් සංවර්ධන නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීමේ විභාගයක් පවත්වා ඇති අතර, එම බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. රජයේ ප්‍රතිපත්තිය මත බඳවා ගැනීමට අවසර දීම තාවකාලිකව නවතා ඇති හෙයින් එම බඳවා ගැනීම සඳහා මෙතෙක් අනුමැතිය ලබාදී නොමැත. | කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන බඳවා ගැනීම් සිදුකළ යුතුය. |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක් පැවති අතර ඒ තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 02 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 03 ක් පැවතිය ද 2020 වර්ෂයේ සිට බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම සහ පුරප්පාඩු පිරවීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරන බැවින් මෙම පුරප්පාඩු පිළිබඳව අදාළ අමාත්‍යාංශයට දැනුම් දී ඇත. | කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන බඳවා ගැනීම් සිදුකළ යුතුය. |